**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකල මතය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාන මාරු වී ගොස් වසර 25 ඉක්ම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා වසර 18 ඉක්ම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.120,741 ක ණය ශේෂයක් මේ දක්වාම නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | දිගු කලක පටන් ගිණුම්වල ඉදිරියට ගෙන එනු ලබන ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියා කල යුතුවීම. | නීතිපති දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට 2018 වර්ෂයේදී ලිපි දෙකක් යවා ඇත. |
| (ආ) වැඩ තහනමකට ලක්වූ නිලධාරියෙකු විසින් නොපියවූ රු.17,000 ක ණයශේෂයක් සඳහා වසර 13 ක් ඉක්මවා තිබුණද මේ දක්වාම මෙම ණයශේෂ අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | නොපියවූ ණය ශේෂ නිරවුල් කර ගැන්මට ක්‍රියාකල යුතුවීම. | මෙම නිලධාරියාගේ විස්තර ලබාදෙන ලෙස ඉල්ලා 2018 ඔක්තෝබර් 31 දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. විස්තර ලද විගස ණය නිරවුල් කිරීමට කටයුතු කරමි. |

### 1.6.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පුරප්පාඩු වූ අභ්‍යන්තර විගණන තනතුර සඳහා ගණකාධිවරියක වැඩ බැලීමේ පදනම මත පත් කල අතර එම අභ්‍යන්තර විගණන විමසුම්වලින් පෙන්වා දෙන කරුණු සඳහා අවශ්‍ය වෙනස්කම් කිරීමට වර්තමානය වන විට පියවර ගෙන ඇත. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගයන්හි පිටපතක් |

| | | | |
|---|---|---|---|
| | කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | විගණකාධිපති වෙත යොමු කිරීමට නොහැකි වූයේ අතපසු වීමකින් වන අතර ඉදිරියේදී මෙවැනි අතපසු වීම් සිදු නොවීමට සටහන් කර ගන්නා ලදී. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ගණකාධිකාරි සේවයේ 111 වන ශ්‍රේණියේ නිලධාරිනියක පත් සිටි අතර ඇය 2018 අගෝස්තු 02 දින සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැරීම නිසා මෙම පුරප්පාඩුව ඇති විය. මෙම තනතුරද ගණකාධිකාරි 1 ශ්‍රේණියේ තනතුරක් ලෙස නැවත සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනිමට යොමු කර ඇත. එතෙක් වැඩ බැලීමේ පදනම මත ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ගණකාධිකාරී පත් කර ඇත. |

### 1.6.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත | | | |
| (i) 5(1) හා 5(2) වගන්ති සහ 2(1) උප | සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ප්‍රකාශිතවම පවරන | රු.මිලියන 5 ඉක්මවූ සෑම | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, |

| | | | |
|---|---|---|---|
| වගන්තිය | ලද නැතහොත් නියම කරන ලද බලය ක්‍රියාත්මක කරමින් කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුලත් අගය රු.5,000,000 ඉක්මවන්නාවූ සෑම පොදු කොන්ත්‍රාත් ගිවිසුමක්ම මෙම පනතේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කල යුතුවේ. ප්‍රසම්පාදනයන් සඳහා ඇතුලත් වීමට අදහස් කර ඇති කොන්ත්‍රාත්කරුවන් 24,345 දෙනෙකු සමාලෝචිත වසර තුල ලියාපදිංචි කර තිබුණද කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කර තිබුණේ ඉන් 398 පමණි. | කොන්ත්‍රාත්තුවක්ම මෙම පනතේ වගන්ති ප්‍රකාර ප්‍රසම්පාදන අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී හා කොන්ත්‍රාතුව පිරිනැමීමෙන් අනතුරුව යන අවස්ථා දෙකෙහිදීම ලියාපදිංචි කරවා ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවීම. | දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන මේ සම්බන්ධව දැනුවත් කර ඇත. ඒ අනුව වාර්ෂිකව පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි සංඛ්‍යාව වැඩිවී ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පොදු කොන්ත්‍රාත් ගිවිසුම් සියල්ල මාර්ගගත ක්‍රමය මඟින් නොබෝ දිනකින් ලියාපදිංචි කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වාදීමට නියමිතව ඇත. |
| (ii) 11(3) වගන්තිය | පනතේ 11(3) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් 14 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව වැඩිපුර කාලයක් සඳහා කලින් කල අලුත් කරනු ලැබිය හැක. එහෙත් වර්ෂයක කාලය ඉක්මවූ පසු නැවත ලියාපදිංචිය අලුත් කිරීම් තුලින් ලබාගන්නා ලද ආදායම් කිසිවක් මේ දක්වා වාර්තා කර නොමැත. | ලියාපදිංචියෙන් වසර ඉක්මවන ලද කොන්ත්‍රාත්වල ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ක්‍රියාකල යුතුවීම. | ගිවිසුම් කාලය ඉක්මවන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් නැවත ලියාපදිංචිය අලුත් කරවා ගැනීම ඒ ඒ ආයතනවල රාජකාරියක් වේ. හඳුන්වාදීමට නියමිත මාර්ගගතක්‍රමය මඟින් වර්ෂයක කාලය ඉක්ම වූ පසු නැවත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල ආයතනය වෙත පද්ධතිය මඟින් දැනුම්දීමට කටයුතු කළ හැක. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 ආදායම් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ආදායම් සංකේත අංක - 20.03.02.10**<br>(i) සමාගම් පනතේ 131 (1) සහ (2) වගන්ති ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයට සීමිත සමාගම්වල වාර්ෂික වාර්තා සඳහා අයවිය යුතුව පැවති හිඟ ආදායම රු.මිලියන 658.20 ක් විය. මෙම හිඟ ආදායමින් සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 36.10 ක් පමණක් අයකර ගෙන ඇති බව වාර්තා වී තිබුණ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 5 ක් වැනි ඉතා අඩු අගයක් විය. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවරයන් ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | හිඟ හිටි ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතු වීම. | සමාගම් නාම අනුමත කිරීම, සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම සහ සහතික පිටපත් නිකුත් කිරීම ආදිය වැඩිවීම නිසා තථ්‍ය ආදායම ඉකුත් වසරට සාපේක්ෂව වැඩි වී ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් වර්ගීකරණ වාර්තාව හා හිඟ ආදායම් වාර්තා අනුව මූල්‍ය වාර්තා ලියාපදිංචි කල යුතු සමාගම් සංඛ්‍යාව 6,893 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කල සමාගම් සංඛ්‍යාව 2,110 ක් විය. එයින් ලබාගෙන තිබූ මුළු ආදායම රු.මිලියන 4.22 ක් වූ අතර ඉන් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබූ ප්‍රමාණය රු.මිලියන 1.4 ක් විය. | ලියාපදිංචි කල සෑම පොදු සමාගමකින්ම මූල්‍ය වාර්තා ලබා ගැනීමට ක්‍රියා කල යුතු වීම සහ හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීමට කටයුතු කළ යුතුවීම. එසේම සමාගම් පනතේ 170(1) ඉහත වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තා ලියාපදිංචි කල යුතු සමාගම් හඳුනාගෙන ඒවායේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කරවීමට කටයුතු කල යුතුව පැවතීම. | ලියාපදිංචි වී ඇති පොදු සමාගම් මූල්‍ය වාර්තා ගොනු කල යුතු අතර මූල්‍ය වාර්තා ගොනු කරන ලෙස දක්වා සමාගම්වලට හා එහි අධ්‍යක්ෂවරුන්ට ලිපි මගින් දැන්වීම් සිදුකර ඇත. |
| (iii) 2005 අංක 11 දරණ සමිති ආඥා පනත අනුව ලියාපදිංචි සමිති විසින් වාර්ෂික වාර්තා ගොනුකල යුතු අතර සමිති ආඥා පනතේ 6(3) වගන්තිය යටතේ 2016, 2017 සහ 2018 වර්ෂයන්හිදී සමිති 178 ක නාමය කපා හැර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තා ගොනු කල යුතු සමිති 12,307 කින් රැස් කරගත යුතු ආදායම රු.මිලියන 12.3 ක් විය. නමුත් සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික වාර්තා ගොනුකර තිබූ සමිති සංඛ්‍යාව 180 ක් පමණක් විය. 2017 වර්ෂය තුලදී සමිති 204 ක් වාර්ෂික වාර්තා ගොනු කර තිබුණි. ඒ අනුව පෙර වර්ෂයට වඩා සමිති 24 කින් වාර්තා ගොනු කිරීම අඩු වී ඇත. 2018 වර්ෂයට අදාලව පමණක් හිඟ සමිති ආදායම රු.මිලියන 12.12 ක් වූ අතර 2018 වර්ෂයේදී ද නව සමිති 1,086 ක් ලියාපදිංචි කර තිබුණි. | ලියාපදිංචි සෑම සමිතියකින්ම වාර්ෂික වාර්තා ගොනු කරවා ගැන්මට ක්‍රියාකල යුතු අතර හිඟ ආදායම් වෙනම් නොපමාව අයකර ගැනීමට ක්‍රියාකල යුතුය. | ක්‍රියාකාරී සමිතිවලින් පමණක් වාර්ෂික වාර්තා ගොනු කිරීම සිදු කරන නමුත් දැනට ලියාපදිංචි සමිති බොහොමයක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. වාර්ෂික වාර්තා ගොනු කරන ලෙස දන්වා සමිතිවලට හා එහි අධ්‍යක්ෂරුන්ට ලිපි මඟින් දැන්වීම් සිදු කරනු ලබන බව දන්වමි. |

**(ආ) ආදායම් සංකේත අංක - 10.03.07.08**

-------------------------------------------

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1500 ක මූලික බදු ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද, වර්ෂය තුල මෙම ආදායම් ශීර්ෂය යටතේ ආදායම් රැස් කර ගෙන | ඇස්තමේන්තු සකස් කිරීමට පෙර ආදායම් එකතු කර ගැනීමේ හැකියාව ඉකුත් වර්ෂයන් සමඟ සසඳා විධිමත් ක්‍රමවේදයන් අනුව සිදු කළ යුතුවීම. | මුදල් පනත අනුමත වන තුරු මෙය තාවකාලිකව නැවැත්වීමට උපදෙස් දී තිබූ බැවින් 2018 වර්ෂයේදී මෙම ආදායම් ශීර්ෂය කිසිදු |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. ගැසට් නිවේදනයක් නිකුත් කිරීමකින් තොරව බදු අය කිරීම නිසා පැන නැගුණු ගැටළුකාරී තත්ත්වය නිසා බදු අයකර ගැනීම අත්හිටුවා තිබුණි. | | ආදායමක් රැස් නොකරන ලදී. |
| (ii) | සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම් අතරින් සමාගම් 15 පමණක් ඉකුත් වර්ෂයට රු.890,000 ක බදු මුදලක් ගෙවා තිබූ අතර එම එකතු කර ගන්නා ලද සියලු බදු මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. | නීතිමය ගැටළු සහගත තත්ත්වයක් ඇති විය හැකි බැවින් ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කල යුතුව තිබුණි. | 2016 වසරට පෙර ලියාපදිංචි කරනලද සියලුම සමාගම් මෙම බදු ගෙවිය යුතු අතර මීට පෙර මෙම බද්ද ගෙවා ඇති සමාගම් මෙම බද්ද ගෙවීමෙන් නිදහස් කර ඇත. මෙසේ අයකරන බදු මුදල භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 10.03.07.08 ආදායම් ශීර්ෂයට බැර කිරීමට කටයුතු කර ඇත. මෙම බදු මුදල නොගෙවූ සමාගම් සඳහා බදු ගෙවීමට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය ලබා දී ඇත. තවද මෙම බදු මුදල පැහැර හරින්නන් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පනතේ 33 හා 34 වගන්තිවලින් දැක්වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග 08 ගොනුකර තිබුණු අතර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වග උත්තරකරු | සමාගම් පනතේ නියමයන්ට අනුකූලව දෙපාර්තමේන්තුව කටයුතු කලයුතු අතර සමාගම් | සමාලෝචිත වසර තුල සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් බාහිර පාර්ශවයන්ට |

| | | |
|---|---|---|
| කරමින් බාහිර පාර්ශවයන් විසින් සමාලෝචිත වසරේ අධිකරණ ක්‍රියාමාර්ග 29 ක් ගොනු කර තිබුණි. | විසින්ද පනතේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම නියාමනය කල යුතුවීම. | එරෙහිව අධිකරණයේ නඩු 08 ක් හා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වග උත්තරකරු කරමින් බාහිර පාර්ශවයන් විසින් නඩු 29 ක් පවරා ඇති බව තහවුරු කරමි. |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවාලාභීන්ගේ අවශ්‍යතා මත ලියාපදිංචි සමාගම් සම්බන්ධව සහතික පත් නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද සේවාලාභීන්ට එම සේවාව ලබා ගැනීම සඳහා සැලකිය යුතු කාල ප්‍රමාදයක් ගතවන බව නිරීක්ෂණය විය. වාර්ෂික වාර්තා ගොනු කිරීම සම්බන්ධයෙන් ක්‍රමවත් අභ්‍යන්තර පාලනය පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් සේවාලාභීන්ට සේවා සැපයීම සඳහා මෙසේ අසාමාන්‍ය ප්‍රමාදයන් ඇතිවන බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ ඉටුකරවා ගත හැකි වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම මඟින් මෙම කාර්යයන් කඩිනම් කිරීම. | ලිපිගොනුවල පවතින අඩුපාඩු පිළිබඳව දැනුම් දෙමින් ඔවුන්ව සම්බන්ධීකරණය කරමින් හැකි තරම් ඉක්මනින් මහජන අවශ්‍යතා ඉටු කිරීමට කැපව සිටින බව. |

### 4.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සම්බන්ධීකරණ අංශ 10 කින් සමන්විත 'ඒ' ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන මෙහි අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර 2018 වසරේ අගෝස්තු මස සිට මේ | පුරප්පාඩු සම්පූර්ණ කර අභ්‍යන්තර විගණනය විධිමත්ව හා ක්‍රමවත්ව මෙහෙයවීම. | අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරිනියක පත්ව සිටි අතර ඇය 2018 අගෝස්තු 02 දින සිට රේඛීය |

| | | |
|---|---|---|
| දක්වාම පුරප්පාඩුව පවතින අතර එම අංශය සඳහා සේවා නියුක්ත කොට ඇති නිලධාරී සංඛ්‍යාව 03 ක් විය. | | අමාත්‍යාංශය වෙත මුදාහැරීම නිසා පුරප්පාඩු වී ඇත. මෙම තනතුර ගණකාධිකාරී I ශ්‍රේණියේ තනතුරක් ලෙස නැවත සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැන්මට යොමු කර ඇත.එතෙක් වැඩ බැලීම සඳහා නිලධාරීනියක් පත් කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සඳහා අනුමත සමාගම් පරීක්ෂක තනතුරු 10 ම පුරප්පාඩුව පැවති අතර එම තනතුරු සෘජුවම සමාගම්වල කටයුතු නියාමනය කිරීම සමඟ සම්බන්ධව පැවතුනි. මෙම තනතුරු සම්පූර්ණයෙන්ම පුරප්පාඩුව පැවතීම නිසා සමාගම් නියාමනය දුර්වල තත්ත්වයක පැවතුනු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු කටයුතු සඳහා සෘජු බලපෑමක් පවතින මෙම තනතුරු සඳහා බඳවා ගැනීම කඩිනමින් සිදුවිය යුතු බව. | සමාගම් පරීක්ෂක තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය නැවත සංශෝධනය කිරීමට සිදුවීම නිසා මෙම බඳවා ගැනීම් අදාල කාල සීමාව තුල සිදු කිරීමට නොහැකි විය. මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර අයදුම්පත් කැඳවා විභාග කොමසාරිස් ජනරාල් මගින් බඳවා ගැනීමේ විභාගයක් පැවැත්වීමට කටයුතු කරමින් පවතී. |